**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව - 2024**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ (''කොමිෂන් සභාව'') 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 76 ඡේදය ප්‍රකාරව රු.6,239,488 ක් වූ පාරිතෝෂික වෙන් කිරීම්වලට අදාළ පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳියාව සහ සම්බන්ධිත ප්‍රවර්තන සේවා පිරිවැයෙහි වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගැළපීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම්වලට අදාළ බැඳියාව සහ සම්බන්ධිත ප්‍රවර්තන සේවා පිරිවැයෙහි වර්තමාන අගය ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපළ පිරියත හා උපකරණ යටතේ වූ පරිගණකවල පිරිවැය සමුච්චිත ක්ෂය අගයන් සඳහා ආරම්භක ශේෂ ගිණුමේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී පරිගණකවල සම්පූර්ණ පිරිවැය ඉක්මවා සමුච්චිත ක්ෂය වටිනාකම දක්වා තිබූ නිසා පිරිවැය සහ ක්ෂය වටිනාකමට අදාළ අගයන් දෙකම ඉවත්කළ බැවින් මූල්‍යමය වශයෙන් බලපෑමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. එම නිසා එසේ අදාළ අගයන් දෙකම ඉවත්කර ඇත. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පිරිවැය හා සමුච්චිත ශේෂයෙහි ආරම්භක ශේෂ අගයන් ගිණුම්වල සටහන් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාර්යාල ලී බඩු හා කාර්යාල උපකරණ 2024 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර තිබූ අතර ඒවායේ පිරිවැය සහ සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් නොකිරීම නිසා වසර අවසානයට එම වත්කම්වල ශුද්ධ අගය පිළිවෙලින් රු.50,761ක් වැඩියෙන් සහ රු.198,061ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | මෙම භාණ්ඩවලට අදාළ පිරිවැය හඳුනාගත නොහැකි වූ නිසා වටිනාකම ගැළපීමට නොහැකි විය. 2025 වර්ෂයේ ගැළපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉවත්කළ වත්කම්වලට අදාළ පිරිවැය සහ ක්ෂය වටිනාකම් ගිණුම්වලට නිවැරදිව ගැළපිය යුතුය. |
| (ආ) වර්ෂය තුළ ආයතනයෙන් ඉවත්වීගිය සේවකයන්ට ගෙවන ලද රු.1,035,590 ක් වටිනා පාරිතෝෂික ගෙවීම්, පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමට මෙන්ම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සේවක වැටුප් හා වේතන යටතේ පාරිතෝෂික ගෙවීම් ලෙසද හර කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය සමාන ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි. | සේවක වැටුප් හා වේතන යටතේ හරකර තිබුණ ද සේවක පාරිතෝෂික ගැළපීම යටතේ එය අඩුකර පෙන්වා තිබුණි. ඒ අනුව දෙසැම්බර් 31 වෙන්කිරීමට අදාළව මෙම මුදල අඩුවී ඇත. | ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) 2024 වර්ෂයට අදාළ වියදම් 04 ක එකතුව රු.1,494,576ක් 2025 වර්ෂයේදී ගෙවා තිබූ නමුත් එම වියදම් 2024 වර්ෂයේ වියදම් ලෙස හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාන ප්‍රමාණයකින් වර්ෂයේ ඌනතාවය අඩුවෙන් හා වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | අඩුපාඩුවක් බව පිළිගනිමි. | වියදම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ඈ) ව්‍යාපෘතියකින් පවරාගෙන තිබුණු යතුරුපැදියක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම ලබාගැනීමට කටයුතු කර ඇති අතර එය ලද පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | පවරාගත් වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 11.3 වගන්තිය | 2024 දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරි මුදල් එකතුව රු.2,987,887 ක්, වර්ෂය අවසන් වීමට ප්‍රථම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතු වුවත්, එසේ කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙතින් විමසීමක් කරනලදී. ඒ සම්බන්ධයෙන් ලැබෙන පිළිතුර අනුව කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන අනුව වර්ෂය අවසානයේ අත ඉතිරි මුදල් භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,852,620 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,218,396 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.634,224 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මූලික වශයෙන් හේතුවී තිබුණේ වැටුප් හා වේතන, සැපයුම් සේවා වියදම් රු.687,383කින් වැඩි වීමට සාපේක්ෂව භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.2,473,500 ක් අඩුවෙන් ලැබීම වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ රු.614,800ක් වැය කරමින් කොමිෂන් සභාව සඳහා ගොඩනගන ලද වෙබ් අඩවිය 2025 ඔක්තෝබර් 24 දින වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. | 2018 වර්ෂයේදී නිර්මාණය කරන ලද වෙබ් අඩවිය 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක විය. වෙබ් අඩවිය නඩත්තුව සඳහා ආයතනයක් තෝරාගැනීමට කටයුතු කරමින් පවතී. මෙම කොමිෂන් සභාව සතුව තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු නොමැති බැවින් වෙබ් අඩවිය සම්බන්ධ කරුණු කාර්යක්ෂමව ඉටුකරගැනීමේ හැකියාවක් නොමැත. | නිර්මාණය කර ගත් වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 42 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 14ක් විය. එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 28ක් වූ අතර 2 ක් වූ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය සම්පූර්ණයෙන් පුරප්පාඩුව පැවතුණි. | භාෂා නිලධාරී සහ භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමට විභාගය පවත්වා ඇත. රියදුරු තනතුරු සඳහා බඳවාගැනීමට අයදුම්පත් කැඳවීමට නියමිතය. අනෙකුත් තනතුරු සඳහා 2026 වර්ෂයේදී බඳවාගැනීමට කටයුතු කරනු ලැබේ. | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර අවශ්‍ය බඳවාගැනීම් කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය අනුව වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ දින 208 ක ප්‍රමාදයක් සහිතවය. | කොමිෂන් සභාව සතුව ගණකාධිකාරී තනතුරක් නොමැති නිසා වැඩබලන ගණකාධිකාරී විසින් රාජකාරී ඉටුකරනු ලබයි. මෙම ප්‍රමාදය ඉදිරියේදී වළක්වා ගැනීමට කටයුතු කරනු ලබන බව. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන 60ක් තුළ භාෂා | භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරීන් තුන්දෙනෙකු ඇතුළත් අවම මානව | ප්‍රායෝගික තත්ත්වයන් සළකා බලා සැලසුම් සකස් කළයුතු අතර සැලැස්මේ |

විගණනයන් සිදු කිරීම අධීක්ෂණය කිරීමට සැලසුම් කර තිබුණ ද සිදුකර තිබුණු අධීක්ෂණ ගණන 31 ක් පමණක් විය. භාෂා අයිතිවාසිකම්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම් ආදිය පිළිබඳ ලැබෙන සියළුම පැමිණිලි විමර්ශනය කිරීමට සැලසුම් කර තිබුණ ද වර්ෂය තුළ ලැබී තිබුණු පැමිණිලි 83 කින් 22ක් පමණක් විසඳා තිබුණි. තවද පෙර වර්ෂයන්වලට අදාළව සමාලෝචිත වර්ෂය තුළ විසඳන ලද පැමිණිලි ගණන 65ක් විය. සම්පතකින් මෙම සියයට 52 ක ප්‍රගතිය ලබා ඇත. කොමිෂන් සභාව 2024.10.01 දින ඉල්ලා අස්වීමෙන් පසු භාෂා විගණන අත්හිටුවීමට සිදුවිය. මෙම වර්ෂය තුළ විසඳා ඇති සම්පූර්ණ පැමිණිලි සංඛ්‍යාව 87 ක් වේ. තවද පැමිණිලි විමර්ශන කාලසීමාව අනුව විමර්ශනය වෙමින් පවතින පැමිණිලි සංචිතයක් පවතී. දැක්වෙන අපේක්ෂිත කාර්යයන් ඉටුකර ගැනීමට ක්‍රියාකළ යුතුය.